# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු , ජාතික ඒකාබද්ධතා , සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
புத்த சாசனம், சமய மற்றும் கலாச்சார அலுவல்கள், தேசிய ஒருமைப்பாடு,சமூக பாதுகாப்பு மற்றும் ஊடகத்துறை அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs , National Integration , Social Security and Mass Media


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல | DSD/Ho/05/MF/08/01/චක්‍ර ලේඛණ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2024.10.04 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ 2021/19 ට පළමු එකතුව**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල / බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු/බැංකු සමිති කළමණාකරුවන් වෙත.**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති, ක්ෂේත්‍රයේ රාජකාරි කරන සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා අතරැදි මුදල් රක්ෂණ වැඩසටහන, කොවිඩ් රක්ෂණ ආවරණ වැඩසටහන ද ඇතුළත්ව ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහන සහ මුදල් සේප්පු සඳහා රක්ෂණ ආවරණ ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.</u>**

උක්ත කරුණට අදාළව 2021.11.23 දින නිකුත් කර ඇති 2021/19 අංක හා 2021.06.07 දින නිකුත් කර ඇති 2021/12 අංක දරන සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ හා බැඳේ.

02. කොවිඩ් වසංගත තත්වයක් ලංකාවේ දැනට නොපවතින බැවින්, 2021.06.07 දින නිකුත් කර ඇති 2021/12 අංක දරන සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛය මෙයින් අවලංගු කරමි. එබැවින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙතින් රු. 40,000/= ක් හා බැංකු සමිති වෙතින් රු. 25.000/= ක් බැගින් එවනු ලබන කොවිඩ් හා හදිසි අනතුරු රක්ෂණ ආවරණ දායක මුදල් 2025 වර්ෂයේ සිට නොඑවන ලෙස දන්වා සිටිමි**<u>. (ආවරණ නිවේදන ලිපි මඟින් දැනුම් දුන් පරිදි 2025 ට පෙර වර්ෂ වල හිඟ කොවිඩ් දායක මුදල් ඇත්නම් එම මුදල් සහ අනෙකුත් රක්ෂණ දායක මුදල් සුපුරුදු පරිදි එවිය යුතුය.)</u>**

03. රක්ෂණ වාරික මුදල් සඳහා චෙක්පත් එවීමේදී බොහෝ සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති අදාළ තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර එවනු නොලබන බව පෙනීගොස් ඇති බැවින් 2021.11.23 දින නිකුත් කරන ලද සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/19 මඟින් හඳුන්වා දී ඇති ඇමුණුම 02 ආකෘතිය මෙම චක්‍රලේඛ එකතුව මඟින් සංශෝධනය කරන බව දන්වමි.

04. එබැවින් 2025 වර්ෂයේ සිට ඉදිරියට වාර්ෂික රක්ෂණ දායක මුදල් වලට අදාළව චෙක්පත් එවීමේදී පහත සඳහන් ආකෘති පත්‍රයන් නිවැරදිව සම්පූර්ණ කර එවිය යුතුය.

1. සමෘද්ධි ප්‍රජාමූල බැංකු - (ඇමුණුම - 1 ආකෘතිය)
2. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති - (ඇමුණුම - 2 ආකෘතිය)


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

05. ඒ අනුව, මෙම නව එකතුව මගින් 2021/19 චක්‍රලේඛයෙහි සඳහන් 7.3, 8.1, 8.2, 8.5 ඡේද පමණක් සංශෝධනය වන අතර, මුල් චක්‍රලේඛයෙහි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතින බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්
1. ලේකම්- බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු , ජාතික ඒකාබද්ධතා , සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - දැ.ගැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අ.ක.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
7. ගරු සභාපති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය - අ.ක.ස.